# ප්‍රතිකර්මය රෝගයට වඩා භයානකද?

# ශ්‍රී ලංකාවේ කොවිඩ් ආණ්ඩුකරණය පිළිබඳ ආවර්ජනා

සංස්කරණය

ප්‍රදීප් පීරිස්

# 6

# නිදහස්-නොවන-අධ්‍යාපනය: වසංගත සන්දර්භයෙහි ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ප්‍රතිපත්තිය තුළ රාජ්‍ය-පුරවැසි සම්බන්ධතා

*හසිනි ලේකම්වසම්*

## හැඳින්වීම

කොවිඩ්-19 වසංගතය මානව සංහතිය මුහුණ දෙන වඩාත්ම බැරෑරුම් අභියෝග වලින් එකක් බවට පත්වෙමින් පවතී. ඊට ප්‍රතිචාර දැක්වීමේ පීඩනය ලොව පුරා ආණ්ඩු වලට සෞඛ්‍යමය, සංවිධානාත්මක, ආර්ථිකමය සහ සමාජමය යන සියළු ආකාර වලින් දැනෙන්නට පටන්ගෙන තිබේ. එහෙත් මෙම පීඩනයන් විවිධ රටවලට දැනෙන්නේ විවිධ ප්‍රමාණයන්ටය. එම වෙනස ප්‍රධාන වශයෙන්ම තීරණය වන්නේ ඔවුන් සතුව පවතින සම්පත්, විශේෂයෙන්ම ආර්ථික සම්පත් වල ප්‍රමාණය මත වේ. වෛරසයේ බලපෑම සියල්ලන්ට එක හා සමාන වුවත්, කවුරුන් ඊට වැඩිපුර නිරාවරණය වන්නේද යන කාරණයේදී, සමාජ-ආර්ථික කරුණු නිසා දියුණු වෙමින් පවතින ලෝකයේ රටවල් වැඩි අවදානමක පවතින බව හඳුනාගත හැකිය.

දරුණු ආර්ථික පීඩා වලින් බැට කමින් සිටි තුන්වන ලෝකයේ රටක් වශයෙන් ශ්‍රී ලංකාව මුල සිටම කොවිඩ්-19 වසංගතයේ සමාජ-ආර්ථික ප්‍රතිවිපාක වලට වැඩියෙන් නිරාවරණය වී තිබුණකි. ආර්ථිකයේ පටන් සියළුම අංශ වල මෙම බලපෑම පැහැදිලිව දැකගත හැකි වූ අතර, එහිදී අවිධිමත් ආර්ථිය කඩා වැටුනු අයුරු කැපී පෙනේ. සංචරණ සීමා නිසා සිය දෛනික ආදායම අහිමි වූ බොහෝ පිරිසක් සඳහා සහනාධාර ලබාදීමේ පැහැදිලි ක්‍රමවේදයක් විශේෂයෙන්ම 2020 අගෝස්තු මාසයේ මහ මැතිවරණයට පසු දක්නට නොවුනි. මෙම කඩාවැටෙන ගෘහස්ථ ආර්ථිකයන්ගේ බලපෑම

වෙනත් මාර්ගයන්ගෙන් ප්‍රකාශයට පත්වූ අයුරු හඳුනාගත හැකි විය. ඒ අතර කොවිඩ්-19 සෞඛ්‍ය රෙගුලාසි උල්ලංඝණය කරමින් ආදායම් මාර්ග සොයා සංචරණය කිරීම, ගෘහස්ථ හිංසනයේ වැඩිවීම සහ, මූලික පැවැත්ම සඳහා වන වියදමවත් දැරිය නොහැකි නිවෙස් වල අධ්‍යාපන කටයුතු කඩාකප්පල් වීම වැනි කාරණා අඩංගුය.

මෙම පසුබිම තුළ මගේ අවධානය යොමු වන්නේ වසංගතය නිසා සාපේක්ෂව අඩුවෙන් බලපෑමට ලක්වූ අධ්‍යාපන ක්ෂේත්‍රයටයි. බොහෝ අභියෝග මධ්‍යයේ වුවද වසංගත සමය තුළ අධ්‍යාපන ක්ෂේත්‍රය අනෙක් ඒවාට සාපේක්ෂව සිය කටයුතු දිගටම කරගෙන ගිය බව පැහැදිලි කරුණකි. මෙහිදී 'නිදහස් අධ්‍යාපනය' යන රාමුව තුළ සිට මා විභාග කිරීමට බලාපොරොත්තු වන්නේ ලංකාවේ රාජ්‍ය-පුරවැසි සම්බන්ධතාවය වසංගතය මඟින් බලපෑමට ලක් කළේ කෙසේද යන්නයි. මාර්ගගත ක්‍රමය තුළ අධ්‍යාපනයට ප්‍රවේශය ලබාගැනීමේ හැකියාව පෞද්ගලික ක්‍රය ශක්තිය මත තීරණය වන පසුබිමක, සමානාත්මතාවයට නිදහස් අධ්‍යාපනයේ ඇති කැපවීම තවදුරටත් එසේම පවත්වා ගත හැකිද යන්න මා මතු කරන මූලික ගැටළුවක් වේ. එහිදී පුරවැසියා සම්බන්ධ රාජ්‍ය වගකීමට කුමක් සිදුවන්නේද යන්න පිළිබඳ විමසීම මගේ අරමුණයි. මාර්ගගත අධ්‍යාපනයට ප්‍රවේශ වීමේදී ඇතිවන අසමානතා දුරලීමට රාජ්‍යය මැදිහත්වීමක් නොකරන තත්වයක් තුළ නිදහස් අධ්‍යාපනයේ ප්‍රජාතන්ත්‍රවාදී හරය කෙමෙන් වියැකී යන බවත්, එම නිසා එය තවදුරටත් නිදහස් අධ්‍යාපනය වීමට හැකියාවක්ද නැති බවත් මගේ තර්කය වේ.

මෙම තත්වයේ ඇති භයානකම ප්‍රවණතාව වන්නේ අපට ලැබීමට අධිකාරයක් ඇති දේ සහ, 'යහපත් ජීවිතය' වශයෙන් අප පෞද්ගලිකව තේරුම් ගන්නා ජීවිතය ළඟා කරගැනීමට අපට අත්‍යාවශ්‍ය වන දේට ප්‍රවේශය මුදල් මඟින් සම්බන්ධීකරණය වීමේ තත්වය සාමාන්‍යකරණය වීමය. මාර්ගගත අධ්‍යාපනය යනු මෙම වසංගත තත්වයට සුවිශේෂී වූ කාරණයක් නොව, අධ්‍යාපනයේ පෞද්ගලීකරණය යන වඩා පුළුල් යථාර්ථය තුළ අරුත් ගැන්වෙන කරුණක් බව අප සිහිතබා ගත යුතුය. මාර්ගගත අධ්‍යාපනයේ මෙන්ම පෞද්ගලීකරණයේද මූලික තර්කනය මුදල් මත පදනම් වේ. මෙම මාර්ගයේ දිගටම ගමන් කළහොත් වඩ වඩාත් පෞද්ගලීකරණය වූ අධ්‍යාපන මාදිලි වලට වැඩි පිළිගැනීමක් ලැබෙනු ඇත. එය දැනට ආරම්භ වී තිබෙන්නේ නිදහස් අධ්‍යාපනයට ඇති ප්‍රවේශය මූල්‍යකරණය වීම තුළිනි.

මෙම පරිච්ඡේදය ගොඩනැගීම සඳහා උසස් අධ්‍යාපන ආයතනයක සේවය කරන්නකු වශයෙන් මගේ පෞද්ගලික අත්දැකීම් මෙන්ම, මෙම ගැටළු පිළිබඳ සාකච්ඡා කරන මණ්ඩප කිහිපයකට සහභාගී වීමෙන් මා නිරාවරණය වන ලද අදහස්ද යොදා ගන්නා ලදී. ඊට අමතරව විකල්ප

ප්‍රතිපත්ති කේන්ද්‍රයේ සමීක්ෂණ අංශය වන Social Indicator මඟින් සිදුකරන ලද 'Socio-Economic Index in the Face of COVID-19' සමීක්ෂණයෙහි සොයාගැනීම් හා, මෙම ගැටළු සම්බන්ධයෙන් ක්‍රියාකාරී වන පුද්ගලයින්, අධ්‍යාපන ක්ෂේත්‍රයේ පිරිස් සහ සිසුන්ගේ පවුල් වල අය හා සිදුකරන ලද ගුණාත්මක සාකච්ඡා කිහිපයක්ද යොදා ගැනුණි. පරිච්ඡේදය ගොඩනඟා ඇත්තේ පළමුව ලාංකේය අධ්‍යාපනය හා වසංගතයට පෙර සිටම එහි සිදුවෙමින් පැවති වෙනස්කම් පිළිබඳ ආවර්ජනයක්ද, ඉන්පසුව වසංගත තත්වය තුළ අධ්‍යාපනය මුහුණ දුන් අභියෝග පිළිබඳ විස්තරයක්ද, අවසාන වශයෙන් මෙම ප්‍රවණතා මඟින් වඩා පුළුල්ව ගම්‍යමාන වන කරුණු පිළිබඳ සාකච්ඡාවක් හා නිගමන කිහිපයක්ද වශයෙනි.

## ලංකාවේ අධ්‍යාපනය සම්බන්ධ ඉතිහාසය

ශ්‍රී ලංකාවට නිදහස් අධ්‍යාපනය හඳුන්වා දෙන්නේ බොහෝ කොටම දෘෂ්ටිවාදීමය ව්‍යාපෘතියක් වශයෙනි. එමඟින් අරමුණු කරන ලද්දේ අධ්‍යාපනය සහ ඒ හරහා ලැබෙන ජීවන අවස්ථා වලට ප්‍රවේශය ලබාගැනීමේදී සමාජ-ආර්ථික වෙනස්කම් තුළින් පමුණුවන බාධා රාජ්‍යයේ මැදිහත් වීමෙන් අවම කිරීමයි. සමාජ අසමානතා අවම කිරීමේ සමානාත්මතාවාදී දෘෂ්ටිවාදයක් වශයෙන් එමඟින් අවාසි සහගත තත්වයක සිටි බොහෝ සමාජ කණ්ඩායම් වලට සමාජ සංචලතාවය සඳහා අවස්ථාව පාදා දෙන ලද්දේ නීතිය සහ වෛද්‍ය වෘත්තිය වැනි සමාජයේ පිළිගැනීමට ලක්වූ වෘත්තීන් වලට ප්‍රවේශය සලසා දීමෙනි (Jayasuriya, 1969, p. 170). එවක අධ්‍යාපන විධායක ඇමතිව සිටි සී.ඩබ්.ඩබ්. කන්නංගර මැතිඳුන්ගේ ප්‍රධානත්වයෙන් ඇරඹි මෙම ක්‍රමය, පශ්චාත් යටත්විජිත ලංකාවේ සමාජ මට්ටම්කරණයට වැඩියෙන්ම දායක වූ සාධකය මෙන්ම, අධ්‍යාපනය ඇත්තන්ගේ වරප්‍රසාදයක් බවට වන වැටහීම නැති කළ කාරණය වශයෙන්ද ඉතා වැදගත් වේ (Amarakeerthi, 2020). එහි ප්‍රජාතන්ත්‍රවාදී ජීව ගුණය මඟින් සමාජයේ ආන්තිකරණයට ලක්වූ කණ්ඩායම් බලගැන්වූ අතර, පුරවැසිභාවය භෞතිකව අර්ථ ගැන්වූ සාධකයක් බවට ඒ හරහා නිදහස් අධ්‍යපානය පත්වන ලදී. එහි මූලිකම අරමුණ වූයේ තමා ජීවත් වන පරිසරය පිළිබඳව පාරන්‍යායාත්මක සහ දේශපාලනික දැනුමක් මෙන්ම, විවේචනාත්මක විඥානයක්ද සිසුවා තුළ වර්ධනය කිරීමයි (Sivamohan, 2021).

එහෙත් නිදහස් අධ්‍යාපනයේ මෙම මුඛ්‍ය අරමුණ මෑත කාලීනව යම් ආකාර පීඩනයකට ලක්වෙමින් පවතී. දීර්ඝ කාලයක් තිස්සේ ඔඩු දුවමින් ඇති ආර්ථික අර්බුද නිසා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ ලෝක බැංකුව වැනි ආයතන වලින් ණය ලබාගැනීමට ශ්‍රී ලංකාවට සිදුවී ඇත. මෙවැනි ආකාරයේ ණය ලබාදෙන්නේ යම් යම් කොන්දේසි මත වන අතර,

එය අධ්‍යාපනයටද පොදු කාරණයකි. එම කොන්දේසි වලට අනුව නිදහස් අධ්‍යාපනය වෙනුවෙන් රාජ්‍යයට දරන්නට සිදුවන බරපැන අඩුකළ යුතුවාක් මෙන්ම, දිගු කාලීනව රාජ්‍ය අංශයෙහි ප්‍රමාණය හකුළුවා දැමීමද සිදුකළ යුතුය. එසේම වෙළඳපොළ ඉල්ලුමට සැපයුමක් වන ආකාරයේ උපාධිධාරීන් සම්පාදනයද මෙම කොන්දේසි අතර වේ (Punchi, 2001; Perera, 2021). මේ සියල්ල ආර්ථික වර්ධනයේ නාමයෙනි.

මෙම වෙනස්කම් තුළින් සන්නිවේදනය වන්නේ 'නව ලිබරල්වාදය' යි. නව ලිබරල්වාදය සමහරක් අවස්ථා වල ආර්ථික වර්ධනය අරමුණු කරගත් ප්‍රතිපත්ති පැකේජයක් ලෙසත්, තවත් අවස්ථා වල ආක්‍රමණශීලී ආඥාදායක ප්‍රාග්ධනයේ මෙවලමක් ලෙසත්, තවත් අවස්ථා වල ඇත්තන් විසින් නැත්තන් සූරාකෑම තුළින් ධනය රැස්කර ගන්නා ව්‍යාපෘතියක් ලෙසත් සහ, තවත් අවස්ථා වල ප්‍රතිව්‍යාප්තකරණයට, ප්‍රජාතන්ත්‍රකරණයට සහ සමාජ සුබසාධනයට ප්‍රතිරෝධය දක්වන සදාචාර විරෝධී දේශපාලන-ආර්ථික ව්‍යාපෘතියක් ලෙසත් හඳුන්වා දී තිබේ (Venugopal, 2015). මගේ වටහා ගැනීම නව ලිබරල්වාදයට එල්ලව ඇති වාමාංශික විවේචනය හා සමපාත වන්නකි; එනම්, එය ප්‍රාග්ධනයේ වැඩි වර්ධනය අරමුණු කරගත් චේතාන්විත, ඉතාම දේශපාලනික මෙන්ම (එනම් අසමානත්වය හා ඊට අදාළ බල සම්බන්ධතා මත පදනම් වූ), ඉතාම නිර්දේශපාලනික (එනම් වෙළඳපොළ අච්චුවට සමස්ත සමාජය සජාතීකරණය කිරීමට ප්‍රයත්න දරන) ව්‍යාපෘතියක්ය යන්නයි.

අධ්‍යාපනය තුළදී නව ලිබරල්වාදයෙන් අරමුණු කරන වෙනස අධ්‍යාපනයෙහි හරය හා ආයතනික ව්‍යුහය යන දෙකටම අදාළ වේ. හරයාත්මකව ගත්විට වෙළඳපොළ උවමනා එපාකම් මත පදනම්ව අධ්‍යාපනය වෙනස් කිරීම අ). අදාළ කුසලතා ලබාදීම (Perera, 2021) සහ ආ). වගකීම් සහගත, එනම් තමා ගැන තමාට බලාගත හැකි පුද්ගලයෙක් බිහිකිරීම තුළින් සිදුවේ. මෙම චින්තනය තුළ ආරක්ෂාව, සෞඛ්‍යය, අධ්‍යාපනය වැනි සමාජ අවශ්‍යතාවන් සපුරාලීමෙහි ලා රාජ්‍යයට තවදුරටත් වගකීමක් නොපවතින අතර, පුද්ගලයන්, ව්‍යාපාර, සංවිධාන, පාසල්, රෝහල් සහ දෙමව්පියන් වැනි ක්ෂුද්‍ර මට්ටමේ ඒකක මඟින් තම තමා පෞද්ගලිකව එම වගකීම දැරීමත්, එසේ දැරීමට ආශා කිරීමත් අපේක්ෂා කෙරේ (Davies and Bansel, 2007, p. 251). ආයතනික ව්‍යුහය ආශ්‍රයෙන් සැළකූ කළ නව ලිබරල්වාදයෙන් අරමුණු කරන්නේ රාජ්‍ය අධ්‍යාපනය සඳහා දරන පිරිවැය අඩු කිරීමයි. එහි ප්‍රතිඵලයක් වශයෙන් කලින් පොදු සමාජ යහපත සඳහා අත්‍යාවශ්‍ය යැයි වටහාගෙන තිබූ මහජන අධ්‍යාපනය, වෙළඳපොළෙහි කොටසක් ලෙස ප්‍රතිනිර්මාණය කිරීම සිදුවේ (එම, p. 254).

ලංකාවේ තෘතීයික අධ්‍යාපනය දැනට දශක දෙකක් පමණ මුළුල්ලේ මෙවැනි විපරිවර්තන වලට මුහුණ දෙමින් සිටින බව සිහිතබා ගත යුතුය (Perera, 2021). වසංගතය නිසා සිදුවන ලද වෙනස්කම් අප තේරුම් ගත යුත්තේ මෙම පසුබිම සිත් දරාගෙනය. එහිදී මාර්ගගත අධ්‍යාපන ක්‍රමයට සිදුවූ මාරුව හුදෙකලා සිදුවීමක් නොව, මෙම වඩා පුළුල් පරිවර්තනයන්ට අදාළ සන්දර්භයේ සිදුවූවක් බව පෙනී යයි.

## කොවිඩ්-19 තත්වය යටතේ අධ්‍යාපනය

මතුපිටින් බැලූ විට අනෙක් ක්ෂේත්‍ර වලට සාපේක්ෂව අධ්‍යාපනය කොවිඩ්-19 වසංගතයෙන් බලපෑමට ලක්වූයේ අවම වශයෙන් බව සිතිය හැකිය. ඒ, නිවසේ සිට වැඩ කරන මාදිලියට අනුවර්තනය වීමට ඊට තිබූ සාපේක්ෂව වැඩි හැකියාව නිසාය. එසේ වුවත් මෙම ආකාරයේ සාර්ව මට්ටමේ ඇගයීම් වලදී සාමාන්‍යයෙන් සිදුවන්නාක් මෙන් මෙහිදීද ක්ෂුද්‍ර මට්ටමේ බොහෝ අපහසුතා මඟහැරී යාමේ ප්‍රවණතාවයක් පවතී. මෙම කොටස තුළ මා බලාපොරොත්තු වන්නේ අධ්‍යාපනය ලබාදෙන්නන් සහ ලබාගන්නන් යන දෙකොට්ඨාශය විසින් වසංගත තත්වය තුළ භාවිතා කරන ලද විවිධ ක්‍රම සහ, තෘණමූල මට්ටමේදී ඒවායෙහි බලපෑම මූලික වශයෙන් හඳුනා ගැනීමයි.

### *ක්‍රමෝපායන්*

වෛරසය පාලනය කිරීම සඳහා ලොව පුරා ගන්නා ලද පියවර අතර රටවල් අගුළු දැමීම් සහ සමාජ දුරස්ථභාවය පවත්වා ගන්නා වෙනත් ක්‍රම ප්‍රධාන විය. එහි ප්‍රතිඵලයක් ලෙස බොහෝ රටවල පාසල් හා විශ්ව විද්‍යාල වසා දැමුනු අතර, අධ්‍යාපන කටයුතු අඛණ්ඩව කරගෙන යෑම සඳහා මාර්ගගත ක්‍රම වලට යොමුවන ලදී (Toquero, 2020). මෙම හදිසි මාරුවෙහි ස්වභාවය නිසා එය ඇත්තෙන්ම හැඳින්වෙන්නේ 'මාර්ගගත ඉගෙනුම' ලෙස නොව 'අර්බුද ඉගෙනුම' ලෙසයි (Pace et al., 2020). මෙම මාර්ගගත ක්‍රම කොතරම් දුරට යොදාගත්තේද යන්න සන්දර්භයෙන් සන්දර්භයට වෙනස් වන කරුණකි. නිදසුනක් ලෙස OECD සංවිධානයෙන් වසංගත තත්වයට ලොව පුරා අධ්‍යාපන ක්ෂේත්‍රයෙන් දක්වන ලද ප්‍රතිචාර පිළිබඳ 2020 දී පල කරන ලද වාර්තාවකට අනුව ඔස්ට්‍රේලියාව වැනි රටවල් පූර්ණ පහසුකම් සහිතව කඩිනමින් මාර්ගගත ක්‍රම වලට යොමු වූවත්, ඊට සාපේක්ෂව අඩුවෙන් සංවර්ධනය වූ රටවල් වල යොදාගත් ක්‍රමෝපායන් වඩා අවිධිමත් විය. ආජන්ටිනාව හොඳ උදාහරණයකි; එම රටෙහි ගුරුවරු සිය සිසුන් අතර වඩාත්ම අනතුරට ලක්විය හැකි මට්ටමේ අය වෙනුවෙන් මාරුවෙන්

මාරුවට පාසලට පැමිණ ඉගැන්වීම් කටයුතු සිදුකිරීමත්, සමහර අවස්ථා වල ආහාර පානාදිය පවා ලබා දීමෙනුත් උපකාර කොට ඇති අතර, ඊට අමතරව අනෙක් සිසුන් වෙනුවෙන් මාර්ගගත ක්‍රම හරහාද ඉගැන්වීම් කටයුතු සිදුකර තිබේ. එම වාර්තාවේම දැක්වෙන පරිදි බෙල්ජියම සහ ඊශ්‍රායලය වැනි රටවල මාර්ගගත ක්‍රම වලට ප්‍රවේශය ලබාගැනීමට අපහසු සිසුන් සඳහා ජාතික රූපවාහිනී නාලිකා හරහා විෂය නිර්දේශ ආවරණය කිරීම සිදුකර ඇත (එම).

ලංකාවේද මෙවැනි ක්‍රමෝපායන් කිහිපයක සම්මිශ්‍රණයක් භාවිතා කෙරේ. එහිදී රාජ්‍ය අධ්‍යාපන පද්ධතිය තුළ මාර්ගගත ක්‍රමයට ඉගැන්වීමේ පහසුකම් වැඩියෙන්ම සලසා දී ඇත්තේ තෘතීයික මට්ටමේ බව කිව හැකිය. ආයතනික මට්ටමින් ස්ථාපනය කරන ලද මාර්ගගත පද්ධති හරහා අධ්‍යාපන කටයුතු දිගටම කරගෙන යාම එහිදී දක්නට හැකිවිය. ද්විතියික අධ්‍යාපනය මෙවැනි ආකාරයේ පහසුකම් සැලසීමට තරම් මධ්‍යගතකරණය කොට නොමැති නිසා බොහෝ පාසල් වලට සිදුව ඇත්තේ විකල්ප ක්‍රම සොයාගැනීමටය. කෙසේ වුවත් මෙම මට්ටම් දෙකටම පොදු ප්‍රවණතාවයක් වන්නේ අධ්‍යාපන කටයුතු වලට ප්‍රවේශය ලබාගැනීම සඳහා සිසුන්ට මෙන්ම ගුරුවරුන්ටද අවශ්‍ය කරන්නා වූ අන්තර්ජාල හා අනෙකුත් තාක්ෂණික පහසුකම් ඇති බවට පූර්ව උපකල්පනයක් කොට තිබීමයි. විශේෂයෙන්ම ද්විතියික මට්ටමේ ගුරුවරුන්ට මේ අරබයා ඇති අභියෝග වඩා අධික බව සිතිය හැක්කේ ආයතනික උපකාර ඔවුන්ට අවමයෙන් හිමිවීම නිසාය.

සම්පත් බෙදී යාම සම්බන්ධව දරුණු විෂමතා පවතින මෙවැනි පසුබිමක මෙම ක්‍රමෝපායන් වල සාර්ථකත්වය සැළකිය යුතු තරම් දුරට අඩු වූ බව ඒ අනුව පැහැදිලිය. නිදසුනක් ලෙස කලින් සඳහන් කළ සමීක්ෂණයට අනුව ජාතික නියැදිය තුළ පාසල් යන වයස් කාණ්ඩයේ 4% කගේ සහ තෘතීයික අධ්‍යාපනය ලබන වයස් කාණ්ඩයේ 0.9% කගේ අධ්‍යයන කටයුතු වසංගතයේ පළමු රැල්ල තරම් කලින් අවස්ථාවකදීම සම්පූර්ණයෙන් ඇණහිට තිබුණි (කරුණාකර ඇමුණුම් අංක 3 හි 45 සහ 46 වගු බලන්න).

විද්‍යුත් උපකරණ වලට ඇති ප්‍රවේශය පිළිබඳ සමීක්ෂණ දත්ත වලින් මේ පිළිබඳ වඩා පැහැදිලි අවබෝධයක් ලබාගත හැකිය. නියැදියෙන් (එනම් කුටුම්බය තුළ ප්‍රාථමික, ද්විතියික හෝ තෘතීයික අධ්‍යාපනයේ නියැලෙන්නන් සහිත පවුල් වලින්) අඩකට වැඩි පිරිසක් මාර්ගගත අධ්‍යාපනයට ප්‍රමාණවත් තරම් විද්‍යුත් උපකරණ තමන්ට පවතින බව පැවසුවද, 31.5% ක ප්‍රමාණයක් එකී විද්‍යුත් උපකරණ පවුලේ අනෙක් අය සමඟ හවුලේ භාවිතා කිරීමට සිදුවන බවත්, 5.6% ක් එම විද්‍යුත් උපකරණ බාහිරින් ඉල්ලා ගැනීමට සිදුවූ බවත් පවසන ලදී. 2% ක් පැවසූයේ මාර්ගගත අධ්‍යාපනයට සම්බන්ධ වීමට තමන්ට කිසිදු ප්‍රවේශයක් නොමැති බවයි (කරුණාකර ඇමුණුම් අංක 3 හි

49 වගුව බලන්න). මාර්ගගත අධ්‍යාපනයට සම්බන්ධ වීමට අවශ්‍ය කරන්නා වූ අන්තර්ජාල සම්බන්ධතාවයන් සහ මූල්‍ය සම්පත් පිළිබඳවද මීට සමාන රටා පිළිබිඹු විය (කරුණාකර ඇමුණුම් අංක 3 හි 50 සහ 51 වගු බලන්න).

සමීක්ෂණයේ මූලික වාර්තාවට අනුව ('Socio-Economic Index in the face of COVID-19', 2021) මෙම කරුණු අරබයා ග්‍රාමීය සහ නාගරික අංශ දෙකේ පැහැදිලි වෙනසක් දැකගත හැකිය. විද්‍යුත් උපකරණ, අන්තර්ජාල සම්බන්ධතාවයන් සහ මූල්‍ය සම්පත් යන කරුණු සම්බන්ධයෙන් ගත්කළ සමස්තයක් වශයෙන් නාගරික ප්‍රතිචාරකයන්ට ග්‍රාමීය ප්‍රතිචාරකයන්ට වඩා හැකියාවක් ඇති බව පෙනුණි (p. 18). රාජ්‍ය අධ්‍යාපන පද්ධතිය තුළ ද්වීතීයික සහ තෘතීයික තල වල අති බහුතරය ග්‍රාමීය සිසුන් වන නිසා මෙම දුෂ්කරතා ඔවුන්ට අදාළ වීමේ ප්‍රවණතාව සමීක්ෂණයෙන් පෙන්නුම් කරනවාටද වඩා අධික බව සිතිය හැකිය.

මෙහිදී වැදගත් වන්නේ සංඛ්‍යාත්මක අගයන් නොවන බවද සැළකිය යුතු කරුණකි. සමානාත්මතාවයට කැප වන බව පවසා ඇති අධ්‍යාපන පද්ධතියක් තුළින් ගම්‍ය වන්නේ සමාන ප්‍රවේශයයි. එම ප්‍රවේශය ලබාගැනීමේදී සම්පත් හිඟතාවය නිසා එක් අයකු හෝ මඟ හැරේ නම් සමානාත්මතාවයට කැප වී ඇති පද්ධතියේ වඩා පුළුල් සදාචාරාත්මක කැපවීම් උල්ලංඝණය වූ බව නිගමනය කිරීමට සිදුවේ.

මෙවැනි අතිශය අසමාන පසුබිමක් තුළ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය අඛණ්ඩව පවත්වාගෙන යෑම සඳහා විවිධ ගුරු-සිසු කණ්ඩායම් විසින් විවිධ ක්‍රමෝපායන් අනුගමනය කරනු ලැබේ. ද්වීතීයික අධ්‍යපාන පද්ධතිය තුළ සේවය කරන ගුරුවරුන් කිහිප දෙනෙකු සමඟ පැවැත්වූ කණ්ඩායම් සාකච්ඡාවකදී අනාවරණය වූයේ පාසල නාගරික එකක්ද නැතිද යන කරුණ මත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය කොතරම් දුරට මාර්ගගත ක්‍රම ඔස්සේ සිදුකළ හැකිද යන්න තීරණය වන බවයි[1]. මෙම කරුණ සමීක්ෂණයේ සොයාගැනීම් සමඟද සමපාත වන්නේ ඉහතින් දක්වා ඇති පරිදි ග්‍රාමීය සහ නාගරික අංශ දෙක අතර පැහැදිලි වෙනසක් එහිදීද හෙළි වූ නිසාය (කරුණාකර ඇමුණුම් අංක 3 හි 49, 50 සහ 51 වගු බලන්න). මාර්ගගතව පැවැත්වෙන පන්ති වලට සහභාගී වන සිසුන් ප්‍රමාණය, ගුරුවරුන්ට එම පන්ති සඳහා ඇති ප්‍රවේශය කොතරම් පහසුද යන කාරණය මෙන්ම, ගුරු-දෙගුරු රැස්වීම් වැනි ද්වීතියික කරුණු කොතරම් දුරට සිදුවනවාද යන ඒවා අරබයා මෙම වෙනස පැහැදිලිව දක්නට තිබුණි.

1 මාතර සහ කළුතර ගුරුවරුන් සමඟ කණ්ඩායම් සාකච්ඡාව (විද්‍යුත් ක්‍රම ඔස්සේ), 2021 මැයි 27.

ඉහත සාකච්ඡාවේදී ග්‍රාමීය පාසලක ගුරුවරියක් පැවසූයේ සිය පන්ති පැවැත්වීම සඳහා සෑම දිනකම පැය 6 ක් වැනි කාලයක් යාබද වැවක් ආසන්නයේ සිටගෙන සිටීමට තමාට සිදුවන බවයි. ඒ, මාර්ගගතව පන්තියක් පැවැත්වීමට අවශ්‍ය තරම් සංඥා ලැබෙන අවට පරිසරයේ එකම තැන එය වන බැවිනි. කුමන ක්‍රමයකින් හෝ විෂය නිර්දේශය සම්පූර්ණ කිරීමට ඔවුන් වෙත එල්ල වන පරිපාලනමය පීඩනය නිසා මෙවැනි තීරණ ගැනීමට ගුරුවරුන්ට සිදුවන බව පැවසුණි. එසේම ග්‍රාමීය සහ නාගරික දෙඅංශයේම පාසල් ගුරුවරු පැවසූයේ මෙම අභියෝග මධ්‍යයේම වෙසක් උත්සවය සඳහා මාර්ගගත සංස්කෘතික උළෙලවල් සංවිධානය කිරීමටද යම් පීඩනයක් එල්ල වූ බවයි. භක්ති ගීත ගායනය වැනි සජීවී එකවිට සිදුවන ක්‍රියාකාරකම් මෙන්ම, සිසුන්ගේ නිවෙස් වල වෙසක් සැමරුම් ඡායාරූප ගෙන්වා ගැනීම වැනි එකවිට සිදුනොවන ක්‍රියාකාරකම්ද ඒ අතර විය.

කෙසේ වුවත් ප්‍රාථමික පාසලක් සහ උසස් පෙළ දක්වා පන්ති පැවැත්වෙන පාසලක විදුහල්පතිවරුන් දෙදෙනෙකු සමඟ පැවැත්වූ සාකච්ඡා දෙකකදී එවැනි පීඩනයක් පිළිබඳ තොරතුරු ලබාගැනීමට නොහැකි විය[2]. මාර්ගගත ක්‍රමයේ ඇති දුෂ්කරතා පිළිගන්නා අතරම ඔවුන් පැවසූයේ තමා සෘජුව වගවිය යුතු කලාපීය අධ්‍යාපන කාර්යාලයෙන් තමන් වෙත එවැනි පීඩනක් එල්ල නොවූ බවයි. ඒ වෙනුවට හැකි උපරිමයෙන් අධ්‍යාපන කටයුතු කරගෙන යන්නට උපදෙස් ලැබුණු බව ඔවුහු කියා සිටියහ. කෙසේ වුවත් මාර්ගගතව අධ්‍යාපන කටයුතු කරගෙන යෑම සඳහා ආයතනික ප්‍රතිපාදන නොලැබුණු බවද, පාසල් විසින් ස්වයංව එම කටයුතු කරගැනීම නිසා වැඩි හා අඩු පහසුකම් සහිත පාසල් අතර පවත්නා ධ්‍රැවලිය තවදුරටත් ශක්තිමත් වී ඇති බවද ඔවුන් පවසන ලදී. නිදසුනක් ලෙස මාර්ගගත අධ්‍යාපන කටයුතු වලට සම්බන්ධ වීම සඳහා අවශ්‍ය නව තාක්ෂණය සහිත ස්මාට් දුරකථනයක්වත් නොමැතිකම නිසා සමහර සිසුන්ට ඉගෙනුම් කටයුතු සම්පූර්ණයෙන්ම මඟහැරී ඇති බව ඔවුන් පෙන්වා දුනි. සුබසාධන රාජ්‍යය පිළිබඳ වඩා පුළුල් රාමුව තුළ සිට බලන කල මෙම සිදුවීම් වල අරුත පසුව විග්‍රහ කෙරෙනු ඇත.

පාසල් සිසුන්ගේ මවුවරුන් සමඟ සිදුකළ තවත් කණ්ඩායම් සාකච්ඡාවක ප්‍රතිචාරකයකු පැවසූයේ මාර්ගගත අධ්‍යාපනයට ප්‍රවේශය නැත්තවුන් සඳහා යම් යම් විකල්ප ක්‍රම යොදාගෙන ඇති බවය. ඒ අතර ළඟම නගරයෙහි කලින් එකඟ වූ ස්ථානයක අදාළ ප්‍රශ්න පත්‍ර හා වෙනත් ලේඛන ගුරුවරුන් විසින් තැබීමත්, සිසුන් ඒවායෙහි ඡායා පිටපත්

2 කුරුණෑගල සහ වලපනේ විදුහල්පතිවරුන් සමඟ කේවල සාකච්ඡා (විද්‍යුත් ක්‍රම ඔස්සේ), 2021 ජූනි 05.

ලබාගැනීම මඟින් පාඩම් කටයුතු වල යෙදීමත් යන ක්‍රමය විය[3]. ආර්ථිකමය අතින් මෙය අනිවාර්යයෙන්ම මාර්ගගත ක්‍රමයට වඩා සහනදායී වුවත්, වසංගත තත්වය තුළ බලාත්මක වූ සංචරණ සීමා හා සමාජ දුරස්ථ වීම් රෙගුලාසි යටතේ මෙම ක්‍රමද එතරම් යොදාගත් බව සිතිය නොහැක. ගුරුවරුන් හා සිදුකළ ඉහත කණ්ඩායම් සාකච්ඡාව තුළින්ද හෙළි වූ පරිදි ඔවුන්ගේ සිසුන් අතර ඉතා දුර බැහැර ප්‍රදේශ වල වාසය කරන, කිසිදු අන්තර්ජාල සම්බන්ධතාවයක් නොමැති මෙන්ම, විශේෂයෙන්ම සංචරණ සීමා යටතේ ළඟම නගරයට පැමිණීම වුවත් ඉතා දුෂ්කර වන අය සිටී. එහි ප්‍රතිඵලයක් වශයෙන් මෙසේ දුරස්ථ ක්‍රම වලින් සිදුකරන අධ්‍යාපන කටයුතු ඔවුන්ට බොහෝ විට මඟහැරී යයි. එක් ගුරුවරයකුට අනුව එවැනි එක් අවස්ථාවක එසේ ලබාගැනීමට සලස්වා තිබූ පුහුණු මධ්‍ය වාර විභාගයක් එක් සිසුන් කණ්ඩායමකට සම්පූර්ණයෙන්ම මඟහැරී ගොස් තිබුණි.


තෘතීයික අධ්‍යාපනික ආයතනයක සේවය කරන්නකු වශයෙන් මගේ පෞද්ගලික අත්දැකීම් තුළින්ද මෙම තත්වය තවදුරටත් පැහැදිලි වේ. මාර්ගගතව පවත්වන්නා වූ දේශන වලට දිගටම සහභාගී වන සිසුන් ප්‍රමාණය පාඨමාලාවකට ලියාපදිංචි වන සිසුන්ගේ ප්‍රමාණයට සාපේක්ෂව දිගටම අඩුවක් පෙන්නුම් කරයි. එමෙන්ම ආයතනික මාර්ගගත පද්ධතියේ කටයුතු වලට සහභාගී වන ප්‍රමාණයට වැඩි සිසුන් ප්‍රමාණයක් WhatsApp වැනි අඩු වියදම් මාර්ග ඔස්සේ අධ්‍යාපනික කටයුතු වලට සම්බන්ධ වන්නේ ඊට වැයවන විද්‍යුත් දත්ත ප්‍රමාණය (data) සාපේක්ෂව අඩු නිසා බව සිතිය හැකිය. සමහරක් අවාසනාවන්ත අවස්ථා වලදී වාර අවසාන විභාගය සම්පූර්ණ කරගත නොහැකි වූ සිසුන් කිහිප දෙනෙකුද සිටි බව හෙළිවිය.

මෙම සිදුවීම් වලින් එල්ල කරන ලද බලපෑම කෙබඳුද? සමානාත්මතාවය මත පදනම් වූ හා, එම නිසා සමාන ප්‍රවේශය සහතික කිරීමට බැඳී සිටින නිදහස් අධ්‍යාපනය යන රාමුව තුළ ස්ථානගත වෙමින් ඊළඟ කොටස් තුළින් මා පිළිතුරු සොයන්නේ මෙම ගැටළුවටය.

## බලපෑම

වසංගතය මඟින් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ඇතිකරන ලද මෙන්ම සමහර අවස්ථා වල වැඩි වර්ධනය කරන ලද අසමානතා ලංකාවට සුවිශේෂී වූවක් නොවන බව ඉහතින්ද දක්වා ඇත. නිදසුනක් ලෙස "පාකිස්ථානයේ සිසුන් බහුතරයකට මූල්‍යමය හා තාක්ෂණික අභියෝග නිසා මාර්ගගත

3 මොණරාගල පාසල් දරුවන් කිහිපයකගේ මවුවරුන් සමඟ කණ්ඩායම් සාකච්ඡාව (විද්‍යුත් ක්‍රම ඔස්සේ), 2021 මාර්තු 06.




මූලාශ්‍රය: බණ්ඩාර, 2021

අධ්‍යාපනයෙන් බලාපොරොත්තු වන ප්‍රතිඵල භුක්ති විඳීමට නොහැකිව තිබේ" (Adnan and Anwar, 2020, p. 45). ඇත්තෙන්ම සාර්ව මට්ටමේ ඉතා ප්‍රශංසනීය දර්ශක සහිත දියුණු වූ රටවල සිසුන්ට වුවත් මාර්ගගත අධ්‍යාපනයට සමාන ප්‍රවේශයන් ඇති බව සිතීම අසීරුය. උදාහරණයක් ලෙස ලී සහ ලලානිට අනුව (2020) එක්සත් ජනපදයේ 15 හැවිරිදි සිසුන් අතරින් 25% කට සිය අධ්‍යයන කටයුතු කරගෙන යෑම සඳහා පරිගණකයක් නොමැත. UNCTAD ආයතනයේ ප්‍රධානී ටෝබියන් ෆ්‍රෙඩ්රික්සන් පවසා ඇත්තේ මෙම කරුණු හේතුවෙන් වඩාත් පුළුල් වන ඩිජිටල් බේදීම නිසා දැනටමත් ප්‍රවේශය අහිමි පිරිස් වඩාත් ආන්තීකරණය වියහැකි බවයි (*Coronavirus reveals need to bridge the digital divide*, 2020). දියුණු වෙමින් පවතින රටවල ඇති වඩාත් තීව්‍ර බේදීම් මෙනිසා තවදුරටත් දරුණු වීමේ හැකියාව පවතී.

වසංගත තත්වය දැනටත් සිදුවෙමින් පවතින්නක් නිසා අධ්‍යාපනයට එහි ඇති බලපෑම සම්බන්ධ විධිමත් පර්යේෂණ ශ්‍රී ලංකාවේ සිදුකෙරී ඇත්තේ ඉතා අල්ප වශයෙනි. කෙසේ වුවත් හදිසියේ මාර්ගගත ක්‍රමයට සිදුකරන ලද මාරුව සම්බන්ධයෙන් රාජ්‍ය අධ්‍යාපන පද්ධතිය තුළ බොහෝ විවේචන එල්ලව ඇත්තේ එහි ප්‍රතිලාභීන් බහුතරය සාපේක්ෂව අඩු වරප්‍රසාද සහිත පසුබිම් වලින් එන බැවින්ය. ජයරත්න (2020) ට අනුව අන්තර්ජාල සහ වෙනත් පහසුකම් අඩුවෙන් පැවතීම නිසා සමහර අවස්ථා වල සිය ඇගයීම් කටයුතු යහළු මිත්‍රයන් ලවා සම්පූර්ණ කරවාගැනීමට පවා සිසුන් යොමුවී තිබේ. මෙවැනි තත්වයක් පවතිද්දීත් සාමාන්‍ය පරිදි වැඩ කටයුතු කරගෙන යාමට හා, සිදුවන ප්‍රමාදයන් හෝ මගහැරීම් තමාට වාර්තා කිරීමට ජනාධිපතිවරයා විසින් කාර්ය සාධක බලකායක් පත්කිරීම පිළිබඳ විවේචන එල්ලව ඇත. සමහර විචාරකයින් පවසා ඇත්තේ මෙම උපදෙස්

සඳහා භාවිතා කොට ඇති වචන තුළින් පද්ධතිමය අසමානතා පෞද්ගලික ශක්තීන් හෝ දුර්වලතා ලෙස සැළකීමක් සිදුව ඇති බවත්, ඒ අනුව උපදෙස් පිළිපැදීමට නොහැකි වීම පෞද්ගලික කැපවීමේ මඳ භාවය හඟවන්නක් බවට පත්ව ඇති බවත්ය (Ranasinghe, 2020). මෙමඟින් නව ලිබරල්වාදී චින්තනයේ ව්‍යාප්තිය පිළිබිඹු කරන බව අප මතක තබාගත යුතුය.

ඉහත දක්වා ඇති සමීක්ෂණ දත්ත වලට අනුව වසංගත තත්වය තුළ මාර්ගගත අධ්‍යාපනයට ප්‍රවේශය කොතරම් ඇහිරී තිබුණිද යන්න පැහැදිලිය. ඊට අමතරව මාර්ගගත අධ්‍යාපනය පිළිබඳ කොතරම් දුරට සෑහීමට පත්වන්නේද යන ප්‍රශ්නයට ලැබුණු පිළිතුරු තුළද එහි සාර්ථකත්වය පිළිබඳව යමක් කියවේ. මේ සම්බන්ධ මතය ප්‍රතිචාරකයන් අතර හරි අඩකින් පමණ බෙදී තිබුණු අතර, එහිදී අඩකට මඳක් වැඩි ප්‍රමාණයක් තමන් ඒ පිළිබඳ සෑහීමට පත්වන බව පවසා තිබේ (කරුණාකර ඇමුණුම් අංක 3 හි 53 වගුව බලන්න). නියැදියෙන් අඩකට ආසන්න ප්‍රමාණයක් මාර්ගගත අධ්‍යාපනය පිළිබඳ සෑහීමට පත් නොවීම තුළ බොහෝ යථාර්ථයන් ඇත. ඉන් එකක් නම් පවතින හා නව අසමානතා විෂයෙහි එහි භූමිකාවයි. තවෙකක් වන්නේ එවැනි සම්පත් හිඟතා වලින් තොර සන්දර්භයන් තුළ වුවද මාර්ගගත අධ්‍යාපනය නිසා සෞඛ්‍යයට අහිතකර බලපෑම් එල්ල වීමයි. පාසල් යන වයසේ ඉතා කුඩා දරුවන් සිටින මවක් සමඟ සිදුවූ පෞද්ගලික පිළිසඳරකදී දවස පුරා පරිගණකයේ එල්බගෙන සිටීම නිසා ඔවුන්ගේ ඇස්, උරහිස් සහ කොඳු නාරටියට ඇතිව තිබෙන බලපෑම පිළිබඳව සඳහන් වුණි[4]. පාසල් හා විශ්ව විද්‍යාල මට්ටමේ ගුරුවරුන් සමඟ කළ සාකච්ඡා[5] මෙන්ම, මගේ පෞද්ගලික අත්දැකීම් තුළින්ද පැහැදිලි වන්නේ ගුරුවරයාගේ පාර්ශ්වයෙන්ද මෙම ගැටළුව පවතින බවය.

තුන්වැනි යථාර්ථය දැනුම් සම්පාදන ක්‍රියාවලියට අදාළ එකකි. මාර්ගගත අධ්‍යාපනයේ සාධනීය ලක්ෂණ - විශේෂයෙන්ම පන්ති කාමරයේ ලබාදෙන අධ්‍යාපනය හා මිශ්‍ර කළවිට - බොහෝ පවතින බව සැබෑය (Dede, 2008). එහෙත් අධ්‍යාපනයේ සමාජමය හා අභිනිර්මාණවාදී භූමිකාව ආශ්‍රයෙහි ගත්කළ එහි බලපෑම යම්තාක් දුරකට සෘණාත්මක වේ. සමාජමය හා අභිනිර්මාණවාදී අධ්‍යාපනයෙන් අරමුණු කරන්නේ ශිෂ්‍යයා මූලික කොටගත්, සන්දර්භයට හා අන්තර්ගතයට සංවේදී දැනුම් නිර්මාණ ක්‍රියාවලියක යෙදීමය (Rovai, 2004; Liaw, 2001). ආබෝ සහ බෙන්බියුනන්-ෆික්ට අනුව (2006, p. 443) සාම්ප්‍රදායික පන්ති කාමරය තුළ පවතින, කාලය

4 පාසල් වියැති දරුවන්ගේ මවක් සමඟ පෞද්ගලික පිළිසඳර, 2021 ජූනි 12.

5 මාතර සහ කළුතර ගුරුවරුන් සමඟ කණ්ඩායම් සාකච්ඡාව (විද්‍යුත් ක්‍රම ඔස්සේ), 2021 මැයි 27; තෘතීයික අධ්‍යාපන ආයතනයක ගුරුවරුන් දෙදෙනෙකු සමඟ පෞද්ගලික පිළිසඳර, 2021 අප්‍රේල් 19.

සහ අවකාශය මඟින් හඳුන්වා දෙනු ලබන ඉතා සාධනීය සන්නිවේදන අවස්ථාවන් මාර්ගගත අධ්‍යාපනය තුළ බොහෝ විට දක්නට නැත. දියුණු තාක්ෂණික ක්‍රමවේදයන් ඔස්සේ මෙවැනි පරිසරයක් නිර්මාණය කිරීමේ හැකියාව පැවතුණද, එවැන්නකින් ප්‍රයෝජන ගැනීම සඳහා ගුරුවරයා සහ සියළුම සිසුන්ට නියමිත ආකාරයේ පහසුකම් පැවතීම සහ සමානව පැවතීම අත්‍යාවශ්‍ය වේ. සමාජයේ පවතින අසමානතා පිළිබඳ මාතෘකාව මෙතැනදී ඉතා වැදගත් වන්නේ එහෙයිනි.

වසංගත සමය තුළ අධ්‍යාපනයේ ස්වභාවය පිළිබඳ පැවැත්වුනු, මා සහභාගී වූ සාකච්ඡා විශාල ප්‍රමාණයක මෙම කරුණු වලට දැඩිව අවධානය යොමු කෙරුණි. එවැනි එක් සාකච්ඡාවක ප්‍රතිචාරකයකුට අනුව මාර්ගගත අධ්‍යාපනය නිසා නිවස තුළ මෙන්ම අසල්වැසියන් අතරද සම්බන්ධතා යම්තාක් දුරකට පළුදු වී ඇත. ඒ, අධ්‍යාපන කටයුතු වලට සම්බන්ධ වීම සඳහා සියළු දෙනාට ප්‍රමාණවත් තරමට විද්‍යුත් උපකරණ නොමැති වීම නිසාය. නිවස තුළ තත්වය ගත්විට, සහෝදර සහෝදරියන් සියළු දෙනාටම යම්තාක් දුරකට හෝ අධ්‍යාපනික කටයුතු වලට සහභාගී වීමට අවස්ථාව ලබාදීම සඳහා සියළුම දෙනාට යම් යම් කටයුතු මඟ හැරීමට සිදුවේ. අසල්වැසියන් අතර පවතින තත්වය සැළකූ විට, ස්මාට් දුරකථන වැනි උපකරණ වලට සාපේක්ෂව වැඩි ප්‍රවේශය සහිත අයවළුන් අන් අයගෙන් ඈත් වීමේ ප්‍රවණතාවක් දක්නට ඇත. ඒ, ඔවුන්ටද එම පහසුකම් පවත්වාගෙන යාමේ වත්කම ඇත්තේ අවමයෙන් නිසා සහ, බෙදාහදා ගැනීමට තරම් හැකියාවක් නැති බැවිනි[6].

තෘතීයික අධ්‍යාපනය තුළද මාර්ගගත අධ්‍යාපනයෙන් ඇති කරන ලද අසමානතා නිසා ඇති වූ බෙදීම් හේතුවෙන් සැළකිය යුතු තරමේ ගැටුම් ජනනය වී ඇත. එක් පසෙකින් නියමිත වේලාවට උපාධි පිරිනමා සිසුන් (කඩා වැටෙන) ආර්ථිකයට නිදහස් කිරීමේ පීඩනය පවතී; අනෙක් පසින් මෙවැනි පීඩන වලට එරෙහි ප්‍රතිරෝධයක්ද ගොඩනැගෙමින් තිබේ. මෙහිදී ගතයුතු ස්ථාවරය පිළිබඳ ගුරුවරු ව්‍යාකූලත්වයට පත්ව සිටිති. අනේක විධ සම්පත් හිඟතාවයන් මධ්‍යයේ විභාග පැවැත්වීමම සදාචාරමය වශයෙන් ගත්කළ බරපතල ගැටළුවක් මතුකරන තත්වයක් එක් පසෙකින් තිබියදී, ඉක්මණින් උපාධිය ලබාගැනීමට සිසුන් වෙතින් ඉදිරිපත් වන සාධාරණ ඉල්ලීම අනෙක් පසින් උභතෝකෝටිකයක් මතුකර තිබේ.

මෙම සියළු වෙනස්කම් තුළින් ඉතා සියුම් ලෙස සිදුවන්නේ අප ජීවත් වන සමාජය සංවිධානය කර ඇති මූලධර්ම තීරණාත්මක ලෙස වෙනස් වීමයි. එමඟින් සමාජ සම්මුතියෙහි ස්වභාවය වෙනස් කරන බව අප සිහිතබා

---

6 පාසල් අධ්‍යාපනය පිළිබඳ ක්‍රියාකාරීන් සමඟ කණ්ඩායම් සාකච්ඡාව (විද්‍යුත් ක්‍රම ඔස්සේ), 2021 අප්‍රේල් 07.

ගත යුතුය. එම නිසා ඊළඟ කොටසේදී මගේ බලාපොරොත්තුව වසංගත සමයේ රජයේ අධ්‍යාපන ප්‍රතිපත්තිය තුළින් මෙම කරුණු වලට එල්ල කරන ලද බලපෑම වටහා ගැනීමයි.

## මේ සියල්ලෙන් ගම්‍ය වන්නේ කුමක්ද?

දේශපාලන ප්‍රජාවක් වශයෙන් අපේ දිශානතිය පිළිබඳ මෙම අත්දැකීම් තුළින් කුමක් ගම්‍ය වන්නේද? අපේ සමාජය සංවිධානය කොට ඇති පදනම් මූලධර්ම පිළිබඳ ඒවායින් කුමක් කියවේද? ගෝලීය අධි වසංගතයක් තුළ සාමාන්‍යකරණය වී ඇති හදිසි තත්වය හා ඒ ආශ්‍රිත හදිසි තීරණ ගැනීමේ පසුබිමක් තුළ එම මූලධර්ම කෙසේ විකාශනය වෙමින් පවතින්නේද? එම විකාශනය ශ්‍රී ලංකාව තුළ සමාජ සම්මුතියට එල්ල කර ඇති බලපෑම කෙබඳුද? මෙම ප්‍රශ්න පිළිබඳව කල්පනා කිරීමේදී වර්තමානයේ කරළියට පැමිණෙන දෘෂ්ඨිවාදීමය සහ මානසික රාමු සම්බන්ධව මතුවන පොදු තේමා දෙකක් තිබේ. මෙම තේමා දෙකම නව ලිබරල්වාදී පද්ධතිය යටතේ සාකච්ඡා කළහැකි බව මගේ මතයයි.

## *නව ලිබරල්වාදී තර්කනය*

මෙම ලිපිය සඳහා පාදක කරගත් සම්මුඛ සාකච්ඡා - විශේෂයෙන්ම ද්වීතියික අධ්‍යාපාන පද්ධතියට සම්බන්ධ ගුරුවරුන්, සිසුන් සහ විදුහල්පතිවරුන් සමඟ - වලින් හෙළි වූයේ නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තියක් පැවතියදී වුවද වසංගත තත්වය තුළ අධ්‍යාපනයේ වගකීම පෞද්ගලිකව ශිෂ්‍යයා, ගුරුවරයා හෝ සමහර විට විදුහල්පතිවරයා විසින් දැරීමේ තත්වයක් උද්ගතව ඇති බවයි. එහි සැබෑ ඛේදවාජකය නම් මෙම තත්වය ඉතාම සාමාන්‍යකරණය වීම තුළ නිදහස් අධ්‍යාපනයට තමාට ඇති අයිතිය පිළිබඳ කතිකාව සම්පූර්ණයෙන්ම මඟහැරී ගොස් තිබීමය. එම අයිතිය සාක්ෂාත්කරණයෙහිලා සුබසාධන රාජ්‍යයෙහි වගකීම පිළිබඳ කිසිදු ප්‍රශ්නයක් මෙම චින්තනය තුළ නොනැගේ.

මා හට සම්මුඛ සාකඡාවක් ලබාදුන් එක් විදුහල්පතිවරයකු තුළ මෙම ආකල්පය පැහැදිලිව දැකගත හැකිවිය. ඉතා අවංකව සිය රාජකාරිය කරන බව සක්සුදක් සේ පැහැදිලි වුවද, ඔහුගේ දැක්මට අනුව මාර්ගගත අධ්‍යාපනයෙහි ගුරුවරයකු යෙදෙන තරම ඇය/ඔහුගේ ව්‍යුහාත්මක සාධක වල නිරූපණයකට වඩා, පෞද්ගලික කැපවීමෙහි නිරූපණයකි. මෙතැන අනිවාර්යයෙන්ම පෞද්ගලික කැපවීම පිළිබඳ ගැටළුවක්ද යම්තාක් දුරකට ඇතත්, තත්වය සම්පූර්ණයෙන්ම ඊට ලඝු කළ නොහැක්කේ සිසුන් හා ගුරුවරුන් යන දෙපිරිසම මාර්ගගත අධ්‍යාපනයට සම්බන්ධ වීමේදී ආර්ථික

සහ තාක්ෂණික ගැටළු වැනි ව්‍යුහාත්මක කරුණු වල බලපෑමට දැඩිව ලක්වන හෙයිනි. මෙහිදී සියළු බර පෞද්ගලිකව කරට ගෙන, 'පද්ධතියට බරක් නොවී' වගකීම් ඉටුකරන පිරිස ("මොකද ආණ්ඩුවටත් සල්ලි නැනෙ")[7] ප්‍රශංසාවට ලක්වන අතර, එතුළ නිදහස් අධ්‍යාපනය සම්බන්ධ ආයතනික වගකීම පිළිබඳ ප්‍රශ්න ඇසීමට අවස්ථාවක් නැත. එහිදී ඉගැන්වීම් කටයුතු කරගෙන යෑම සහ අදාළ කියවීම් ආදිය උඩුගත කිරීම සඳහා ආයතනිකව සපයනු ලබන පද්ධතියක නොපැවැත්ම ප්‍රශ්න නොකෙරේ; ඒ වෙනුවට ප්‍රශ්න කෙරෙන්නේ පුද්ගලිකව බරපැන නොදැරීම තුළින් විද්‍යාමාන වනවා යැයි කියවෙන උනන්දුව සහ කැපවීමෙහි මඳ භාවයයි.

මෙම විදුහල්පතිවරයා ඇත්තෙන්ම සිය කාර්ය මණ්ඩලයේ අදාළ වියදම් දැරීමට ශක්තියක් නොමැති සාමාජිකයන්ට මාර්ගගතව ඉගැන්වීම් කටයුතු කරගෙන යාම සඳහා අවශ්‍ය ඩේටා පැකේජ සිය පෞද්ගලික මුදල් වලින් මිලට ගෙන දුන් අයෙකි. එමෙන්ම සිය දරුවන්ගේ මාර්ගගත අධ්‍යාපන කටයුතු සඳහා බරපැන දැරිය නොහැකි දෙමව්පියන්ටද ඉතා සද්භාවයෙන් ඔහු උපදෙස් දී තිබුණේ අනාගතය වෙනුවෙන් ඉතිරි කොට ඇති මුදල් හෝ වියදම් කොට අදාළ ස්මාට් දුරකථන වැනි සම්පත් ලබාගන්නා ලෙසයි. කැපවීම සහ අවංකභාවය අතින් ගත්විට ඉතාම ප්‍රශංසනීය වුවත්, මෙවැනි පියවර නිසා ඇත්තෙන්ම සිදුවන්නේ අයිතිවාසිකම් පිළිබඳ කතිකාවක් හෝ කරළියට පැමිණීමට ඇති අවස්ථාව ඇහිරීම බව අප පිළිගත යුතුය.

තෘතීයික අධ්‍යාපනය තුළ මේ පිළිබඳ ඇති විමසිලිමත් බව සාපේක්ෂව වැඩිය. දශක ගණනාවක් මුළුල්ලේ විශ්ව විද්‍යාල අවකාශය තුළ දිග හැරුණු අරගල හා ඒ ආශ්‍රිතව වර්ධනය වූ දේශපාලනික විඥානය මීට හේතුවක් විය හැකිය. සමාන ප්‍රවේශය පිළිබඳ සාකච්ඡා කොතරම් දුර්වලව වුවද සිදුවෙමින් පවතී; පීඨ මට්ටමින් සාමූහික තීරණ ගැනීමේ යාන්ත්‍රණ පැවතීමද එයට රුකුලක්ව තිබේ. එමෙන්ම ආයතනික වශයෙන් මාර්ගගත අධ්‍යාපන කටයුතු පවත්වා ගැනීම සඳහා අවශ්‍ය පද්ධති නිර්මාණය කොට තිබීම සහ, ඉගෙනුම් කටයුතු කුමනාකාරයෙන් සිදුවිය යුතුද යන තීරණය ගැනීමට ගුරුවරුන්ට නිදහස ලබාදීම තුළ ගුරුවරුන් කෙරෙහි එල්ල වන පීඩනය සහ සිසුන්ට දැරීමට වන බරපැන යන දෙකම අවම කොට තිබේ.

එහෙත් මෙහි අදහස සරසවිය තුළ සියල්ල ප්‍රශස්ත ආකාරයෙන් සිදුවන බව නම් නොවේ. කාර්යක්ෂමතා ආඛ්‍යානයට පරිපාලනයෙන් මෙන්ම, හැකි ඉක්මණින් උපාධිය ලබා ගැනීමට වෙහෙසන සිසුන් වෙතින්ද වැඩි පිළිගැනීමක් ලැබී ඇත. ඔඩුදුවන විරැකියාව පිළිබඳ යථාර්ථය මේ තර්කනය තුළ සැළකිල්ලට ගෙන ඇති බව සිතීම අපහසු වේ. විශේෂයෙන්ම වසංගත

7 වලපනේ විදුහල්පතිවරයකු සමඟ කේවල සාකච්ඡාව (විද්‍යුත් ක්‍රම ඔස්සේ), 2021 ජූනි 05.

තත්වය තුළ පවතින රැකියාද අහිමි වීමේ තත්වයකදී නව උපාධිධාරීන් සම්බන්ධයෙන් මෙම ආර්ථිකයට සැලසුමක් නොමැති බව නොකිවමනාය. එහෙත් විරැකියාව සම්බන්ධ සියළු වරද උසස් අධ්‍යාපනායතන පිට පටවා ඇත්තේ, ඊට හේතුව අදාළ කුසලතා සිසුන්ට ලබා දී නොමැති බවට වන චින්තනය සමාජගත කරමිනි. එම නිසා ආර්ථිකයේ පවතින ඉතා විශාල සිදුරෙන් අවධානය වෙනතක හරවමින්, හැකි සෑම අයුරින්ම සිසුන්ගේ කුසලතා දියුණු කරන්නට සරසවි ගුරුවරුන් කෙරෙහි පීඩනයක් එල්ල වෙමින් තිබේ.

### *නව ලිබරල් ආචාර ධර්ම සහ මානසිකත්වය*

අප ගන්නා තීරණ තුළ අයිතීන් පිළිබඳ සවිඥානිකත්වය මඳින් මඳ ඉවතට යන විට එම ප්‍රතිමානීය හිඩැස පුරවන්නට පැමිණෙන්නේ කාර්යක්ෂමතාවය පිළිබඳ චින්තනයකි. එවැනි චින්තනයක් නිසා අවාසියට ලක්විය හැක්කන් ඇතුළු සියළු දෙනාම සිය අයිතීන් අවධාරණය කිරීම හෝ අයිතීන් පිළිබඳ කතා කිරීමට හැකියාව ලබාදෙන දේශපාලනික-සදාචාරමය කැපවීම් වලට අවධානය දක්වනු වෙනුවට, ‘වැඩ ඉවරයක් කරගැනීමේ’ මානසිකත්වයකට අනුගත වෙමින් සිටිති. මෙයාකාර මානසිකත්වයක් සාමාන්‍යකරණය කරන නව ලිබරල්වාදී චින්තනය තුළ පුද්ගලවාදී තර්කනය ඉතා තදින් මතුවන නිසා පොදු අයිතීන් පිළිබඳ හැඟීමක් හෝ නැතිව යන තත්වයට පත් වෙමින් තිබේ.

මෙවැනි පසුබිමක් තුළය නිදහස් අධ්‍යාපනය සහ එහි අනාගත ගමන් මාර්ගය පිළිබඳව අප සළකා බැලිය යුත්තේ. තමාට හෝ තම පවුලේ අයට අධ්‍යාපනයට ඇති ප්‍රවේශය තහවුරු කිරීම තම පෞද්ගලික වගකීමක් ලෙස සැළකීමට පුරවැසියා පුරුදු වෙත්ම, නිදහස් අධ්‍යාපනය යන සංකල්පය ඉවතට තල්ලු වී ඒ වෙනුවට අධ්‍යාපනය යනු පෞද්ගලික ක්‍රය ශක්තිය මත තීරණය වන්නක් බවට වන වටහා ගැනීම සාමාන්‍යකරණය වේ. එමගින් සිදුවන්නේ අධ්‍යාපනය කෙමෙන් වෙළඳ භාණ්ඩයක් සේ සැළකීමට පුරවැසියන් යොමු වීමයි. වසංගත සමය තුළ පෞද්ගලික මාදිලි වල අධ්‍යාපනයෙහි පැවැත්මට අවධානය යොමුකිරීම මේ සම්බන්ධයෙන් වැදගත් වේ. සමීක්ෂණයෙන් හෙළි වූ පරිදි කුටුම්බය තුළ පාසල් යන වයසේ දරුවන් සිටින ප්‍රතිචාරකයන්ගෙන් 79.7% ක් පැවසූයේ වසංගතය තුළ දිගටම පෞද්ගලික උපකාරක පන්ති පැවැත්වූ බවයි (කරුණාකර ඇමුණුම් අංක 3 හි 54 සහ 55 වගු බලන්න).

නිදහස් අධ්‍යාපනය අර්ධ වශයෙන් කඩා වැටීමට ලක් වෙමින් පවතින අවස්ථාවකදී වුවත් පෞද්ගලීකරණය වූ අධ්‍යාපන මාදිලි කිසිදු අපහසුතාවයකින් තොරව ඉදිරියට පැවතීම තුළ ඉහතින් දැක්වූ නව ලිබරල්වාදී තර්කනය සහ එතුළ අපේ ප්‍රමුඛතා පිළිබඳව යමක් කියවේ. අධ්‍යාපනය

තුළ සිදුවන්නා වූ වෙනස්කම් වලට මෙම මානසිකත්වය හේතුවක් වනවාක් මෙන්ම එහි ප්‍රතිඵලයක්ද වේ. ඉහතින් දැක්වූ විදුහල්පතිවරයාද පෞද්ගලික උපකාරක පන්ති පිළිබඳව ඉතා ප්‍රශංසා මුඛයෙන් කතා කළේය. ඔහුට අනුව ගුරුවරු සිය වගකීම් පිළිබඳව බරපතලව සිතා බැලීම තුළින් ඇති කළ හැකි වෙනසට හොඳ උදාහරණයකි පෞද්ගලික උපකාරක පන්ති. එම වෙනසට හේතුව ගුරුවරයාගේ කාර්ය සාධනය මත පදනම්ව ලැබෙන ප්‍රතිලාභ (මුදල් සහ/හෝ පිළිගැනීම) තීරණය වීමයි. මින් ඉගෙන ගත යුතු පාඩමක් ඇතත්, මෙවැනි තර්ක වලින් තවදුරටත් අධ්‍යාපනය මූල්‍යකරණය වීමට මඟ පාදන අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් නිදහස් අධ්‍යාපනය සහ එහි දෘෂ්ටිවාදය සම්පූර්ණයෙන්ම වියැකී ගොස් අධ්‍යාපනය වෙළඳ භාණ්ඩයක් බවට පත්වීම සිදුවන බවද මතක තබාගත යුතුය.

මෙමඟින් වඩා පුළුල්ව පෙන්වා දීමට මා උත්සහ කරන්නේ පැතිර යන්නා වූ නව ලිබරල්වාදීමය තර්කනය තුළ දේශපාලන ප්‍රජාවක් වශයෙන් අපේ ප්‍රජාතන්ත්‍රවාදී කැපවීම් අමතක කර දැමීමට අපව යොමුකරන ආකාරයත්, එතුළ ආචාර ධර්ම යන්න වෙළඳපොළ මඟින් තීරණය කරන්නා වූ දෙයක් බවට පත්වීමත් පිළිබඳ යථාර්ථයයි. මෙම රාමුවෙහි සිට බැලූ කල පෞද්ගලික කැපවීම සහ වගකීම් ගැනීමේ හැකියාව යන ගුණාංග, අයිතීන් පිළිබඳ කතා කිරීමට වඩා සදාචාරාත්මක කාරණයක් වශයෙන් පෙනී යයි. එසේ අයිතීන් පිළිබඳ කතා කරන්නන් ඇත්තෙන්ම කුසීත බවට වැටහීමක්ද මෙම චින්තනය තුළ හඳුන්වා දී ඇත. මෙම නව චින්තනය කෙමෙන් මුල්බැස ගන්නා විකාශනාත්මක අවස්ථාවක් වන වර්තමානයෙහි නිදහස් අධ්‍යාපනය භාවිතා කරන්නේ එම විකාශනය හීන් නූලෙන් සිදුවන තුරු භාවිතා කළහැකි ප්‍රගතිශීලී ආඛ්‍යානයක් ලෙස පමණි.

## නිගමනය

මෙම පරිච්ඡේදය තුළ මගේ අරමුණ වූයේ කොවිඩ්-19 වසංගතය මඟින් රාජ්‍යය සහ පුරවැසියා අතර සම්බන්ධතාවය කෙරෙහි එල්ල කළ බලපෑම අධ්‍යාපනය ආශ්‍රයෙන් තේරුම් ගැනීමයි. එහිදී ආරම්භක ලක්ෂ්‍යය වශයෙන් මාර්ගගත අධ්‍යාපනයට හදිසියේ කරන ලද මාරු වීම යොදාගන්නා ලදී. මාර්ගගත අධ්‍යාපනයට ප්‍රවේශය ආයතනික මට්ටමින් සලසා නොදීම සහ එය පුද්ගලයාගේ පෞද්ගලික ක්‍රය ශක්තිය මත රඳා පැවැත්ම තුළ නිදහස් අධ්‍යාපනයට තවදුරටත් එම නාමය දිය හැකිදැයි යන ගැටළුව පැන නැඟේ. නිදහස් අධ්‍යාපනයේ පදනම් වටිනාකමක් වන සමානාත්මතාවය එහිදී අමතක කොට දැමීමක් සිදුකර ඇති අතර, එම නිසා සමාජයේ පවතින අසමානතා, අධ්‍යාපනයට ප්‍රවේශය ලබාගැනීමේදී ප්‍රතිනිර්මාණය වී ඇති බව දැකිය හැකිය.

මෙම ප්‍රවණතා වල ගම්‍යයන් වසංගත තත්වයෙන් ඔබ්බට බලපාන අතරම, ඒවාට හේතු වසංගත තත්වයට පෙර සිටම පැවති ඒවා බව මතක තබාගැනීමද වැදගත්ය. අවම ආයතනික සම්බන්ධීකරණයක් සහිතව, වෙනත් විකල්පයක් නොමැති තත්වයක් ලෙස මාර්ගගත අධ්‍යාපන ක්‍රමය වැළඳ ගැනීම තුළ අධ්‍යාපනයට ඇති ප්‍රවේශය මූල්‍යකරණය වීමත්, එමගින් දිගු කාලීනව අධ්‍යාපනය මූල්‍යකරණය වීමත් සිදුවේ. අධ්‍යාපනයට ඇති ප්‍රවේශය මූල්‍යකරණය වූ විට එය තවදුරටත් රාජ්‍ය ආයතන වල වගකීමක් නොව වෙළඳ භාණ්ඩයක් බවට පත්වීම වැළැක්විය නොහැක. එවිට වෙළඳපොළ තර්කනය අධිපති තැනක් ගන්නා අතර, විෂමතාවය ඔඩුදුවා යද්දී වුවත් අයිතීන් පිළිබඳ කිසිදු කතිකාවක් කිරීමට නොහැකි තත්වයක් උද්ගත වනු ඇත.

මෙම තත්වයට කිසිදු ප්‍රතිරෝධයක් නොවීම හා වගකීම පුද්ගලයාට කේවලව අනුයුක්ත වීමේ තත්වය සාමාන්‍යකරණය වීම තුළ නව ලිබරල් යුගයේ දේශපාලන මන්දෝත්සාහී භාවය මොනවට පිළිබිඹු වේ. 'ඉක්මණින් වැඩ ඉවරයක් කරගැනීමේ' කාර්යක්ෂමතා ආඛ්‍යානය මෙයට හොඳ අනුපූරකයකි. ඒ, එමගින් නියමිත කලට උපාධිය ලබා ශ්‍රම බලකායට සම්බන්ධ විය හැකිය යන අර්ධ මිථ්‍යාව සාමාන්‍යකරණය කරන හෙයිනි. මෙම චින්තනය දැන් සාමාන්‍ය බුද්ධිය බවට පත්වී හමාරය.

මේ සිදුවන්නේ අධ්‍යාපනය තුළින්ද නව ලිබරල්වාදය සමාජයේ මුල්බැස ගැනීමකි. එහිදී අධ්‍යාපනය තවදුරටත් සමාජ සාධාරණත්වයේ හෝ අයිතිවාසිකම් වල නාමයෙන් ක්‍රියාත්මක වන්නක් නොව, කේවල ආර්ථික අරමුණු සාක්ෂාත්කරණය සඳහා ක්‍රියාත්මක වන වෙළඳ භාණ්ඩයක් බවට පත්වෙමින් තිබේ. වෙළඳපොළට අවශ්‍ය ආකාරයෙන් අධ්‍යාපනය අනුවර්තනය කරගැනීමේ මෙම ගමනේදී නිදහස් අධ්‍යාපනය යනු හුදු එම විකාශනය සැඟවීම සඳහා භාවිතා කරන ප්‍රගතිශීලී ආඛ්‍යානයක් පමණි.

## ආශ්‍රිත ග්‍රන්ථ

Adnan, M. and Anwar, K. (2020) 'Online Learning amid the COVID-19 Pandemic: Students' Perspectives', *Journal of Pedagogical Sociology and Psychology*, 2(1), pp. 45–51.

Amarakeerthi, L. (2020) 'Let's Make Our Education "More Open Than Usual"', *Colombo Telegraph*, 16 December. Available at: https://www.colombotelegraph.com/index.php/letsmake-our-education-more-open-than-usual/ (Accessed: 24 July 2021).

Arbaugh, J. B. and Benbunan-Fich, R. (2006) 'An Investigation of

Epistemological and Social Dimensions of Teaching in Online Learning Environments', *Academy of Management Learning & Education*, 5(4), pp. 435–447.

Bandara, S. (2021) *Facebook*. Available at: https://www.facebook. com/ArtOfSajith/photos/a.281558598710607/1858830217650096/?type=3 (Accessed: 24 July 2021).

*Coronavirus reveals need to bridge the digital divide* (2020) *UNCTAD*. Available at: https://unctad.org/news/coronavirus-revealsneed-bridge-digital-divide (Accessed: 24 July 2021).

Davies, B. and Bansel, P. (2007) 'Neoliberalism and education', *International Journal of Qualitative Studies in Education*, 20(3), pp. 247–259. doi: 10.1080/09518390701281751.

Dede, C. (2008) 'A Seismic Shift in Epistemology', *EDUCAUSE Review*, 43(3), pp. 80–81.

Jayaratne, H. (2020) 'Covid-19 Through The Perspectives Of Children & Youth', *Colombo Telegraph*, 3 July. Available at: https://www. colombotelegraph.com/index.php/covid-19- through-the-perspectives-of-children-youth/ (Accessed: 24 July 2021).

Jayasuriya, J. E. (1969) *Education in Ceylon before and after independence: 1939-1968*. 1st edition. Associated Educational Publishers.

Li, C. and Lalani, F. (2020) *The COVID-19 pandemic has changed education forever. This is how, World Economic Forum*. Available at: https://www.weforum.org/agenda/2020/04/ coronavirus-education-global-covid19-online-digitallearning/ (Accessed: 24 July 2021).

Liaw, S.-S. (2001) 'Designing the hypermedia-based learning environment', *International Journal of Instructional Media*, 28(1), pp. 43–56.

Pace, C., Pettit, S. and Barker, K. (2020) 'Best Practices in Middle Level Quaranteaching: Strategies, Tips and Resources Amidst COVID-19', *Becoming: Journal of the Georgia Association for Middle Level Education*, 31(1), pp. 2–13. doi: 10.20429/ becoming.2020.310102.

Perera, K. (2021) '"Marrying the Monster": World Bank Loans and English Language Projects in Sri Lankan Universities', *University of Colombo Review*, 2(1), pp. 42–60.

Ranasinghe, P. (2020) 'Zooming of Education', *Groundviews*, 21 June.

Available at: https://groundviews.org/2020/06/21/ zooming-of-education/ (Accessed: 24 July 2021).

Rovai, A. P. (2004) 'A constructivist approach to online college learning', *The Internet and Higher Education*, 7(2), pp. 79–93. doi: 10.1016/j.iheduc.2003.10.002.

Sivamohan, S. (2021) 'Kuppi Talk: setting the terms of the debate on education', 3 February. Available at: http://island.lk/kuppitalk/ (Accessed: 24 July 2021).

'Socio-Economic Index in the face of COVID-19' (2021) *Centre for Policy Alternatives*, 30 June. Available at: https://www. cpalanka.org/socio-economic-index-in-the-face-of-covid-19/ (Accessed: 30 June 2021).

Toquero, C. M. (2020) 'Challenges and Opportunities for Higher Education Amid the COVID-19 Pandemic: The Philippine Context', *Pedagogical Research*, 5(4). Available at: https:// eric. ed.gov/?id=EJ1263557 (Accessed: 24 July 2021).

Venugopal, R. (2015) 'Neoliberalism as concept', *Economy and Society*, 44(2), pp. 165–187. doi: 10.1080/03085147.2015.1013356.